කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

කාර්ය පත්‍රිකාව

විෂය- ව්‍යාපාර සංඛ්‍යානය

**සංගහන පරාමිති නිමානය සඳහා ප්‍රාන්තර නිමානය භාවිත කරයි.**

**ශ්‍රේණිය - 13**

**පාඩම - 7**

නිපුණතාව 7.0 - ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන නිමානය යොදා ගනියි.
නිපුණතා මට්ටම 7.7 - සංගහන පරාමිති නිමානය සඳහා ප්‍රාන්තර නිමානය භාවිත කරයි.

කර්මාන්ත ශාලාවක දෛනික මධ්‍යන්‍ය නිමැවුම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය ව ඇත.ඒ සඳහා දින 25ක් තුළ ලබා ගත් දත්ත රැස් කර මධ්‍යන්‍ය නිමැවුම ඒකක 100ක් ලෙස ලබා ගෙන ඇත.දෛනික නිමැවුම්වල විචලතාව 36 බව කර්මාන්තශාලා හිමිකරු අත්දැකීමෙන් දනියි.95%ක විශ්‍රම්භ මට්ටමක් යටතේ දෛනික මධ්‍යන්‍ය නිමැවුම් ප්‍රමාණය ඇස්තමේන්තු කළ විට ලැබෙන ප්‍රකාශය පහත දැක්වේ.

$100 \pm 1.96 \times \frac{6}{5}$

එය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න.

1.) ප්‍රකාශනයේ දකුණු පස කොටස සුළු කරන්න.
2.) 100-2.352 හා 100 + 2.352 ලබා ගන්න.
3.) සංගහන මධ්‍යන්‍යය සඳහා ලැබිය හැකි අගයන් ඇතුළත් ප්‍රකාශනයක් ලබා ගන්න.
4.) ඉහත ප්‍රකාශනයේ දකුණු පස සඳහා ලැබුණු 2.352 න් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
5.) ලක්ෂ්‍යමය නිමානයට වඩා ප්‍රාන්තර නිමානයේ යෝග්‍යතාව පැහැදිලි කරන්න.